දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

බුද්ධ චරිතය

08 වන පාඩම ; බුදුරදුන් ලොවට හෙළිකළ ශ්‍රේෂ්ඨ ධර්මය

[[2024/2025]] 05 වන ප්‍රශ්නය

I –

II –

III –

IV බුදුරදුන් අවබෝධ කළ දුක්ඛ ආර්ය සත්‍යයට ඇතුළත් දුක කෙටියෙන් විවරණය කරන්න.

[[2019/2020]] 06 වන ප්‍රශ්නය

I ධම්මචක්කප්පවත්තන සූත්‍රයේදී බුදුරදුන් විසින් දේශනා කරනු ලැබූ පැවිද්දන් විසින් අත්හළ යුතු අන්ත දෙක නම් කොට, ඒවා එසේ හැඳින්වීමට හේතු දක්වන්න.

II දුක්ඛ සමුදය ආර්ය සත්‍යය කෙටියෙන් විස්තර කරන්න.

III ධම්මචක්කප්පවත්තන සූත්‍රයේදී චතුරාර්ය සත්‍යයේ එක් එක් සත්‍ය බෙදා ඇති කොටස් තුන නම් කර ඒවා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

IV බුදුන් විසින් සාක්ෂාත් කරන ලද මධ්‍යම ප්‍රතිපදාව ගෙනහැර දක්වා, සංකීර්ණ සමාජයේ අවිවේකී ජීවිත ගත කරන ජනතාව වෙත ඉන් ලබා දෙන මාර්ගෝපදේශ පෙන්වා දෙන්න.

[[2018/2019]] 05 වන ප්‍රශ්නය

I බුදු සස්නෙහි ප්‍රථම ද්වේවාචික උපාසකවරු නම් කොට, ඔවුන් එසේ හැඳින්වීමට හේතු දක්වන්න.

II බුදුසසුනෙහි පළමු රහතන් වහන්සේලා අතුරින් සිව් දෙනෙකු නම් කොට, උන්වහන්සේලා රහත්භාවය ලැබීමට ශ්‍රවණය කළ සූත්‍ර දේශනාව නම් කරන්න.

පිළිවෙළ හාමුදුරුවෝ

III පස්වග තාපසවරුන් සොයා ඉසිපතනයට වැඩම කරන බුදුරජාණන් වහන්සේ හා අතරමග මුණ ගැසුණු උපක ආජීවක අතර ඇතිවූ සංවාදය ලියා දක්වන්න.

IV බුදුරදුන් විසින් සිදු කළ පළමු ධර්ම දේශනයේ ඇතුළත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය ත්‍රි ශික්ෂාවට අනුව බෙදා දක්වමින් ශීලය ආර්ය මාර්ගයේ පදනම වන අයුරු පැහැදිලි කරන්න.

[[2017/2018]] 06 වන ප්‍රශ්නය

I බුදුරදුන් වෙත පැමිණ පැවිදි වූ යසකුල පුතුගේ ළඟම මිතුරන් හතර දෙනා නම් කරන්න.

[[2016/2017]] 06 වන ප්‍රශ්නය

I බුදුන්ගේ පළමු ධර්ම දේශනය කිනම් නගරයක කොතැන්හීදී කවුරුන් අරබයා කිනම් සූත්‍රයක් ලෙස දේශනා කරන ලද්දේ දැයි ලියන්න.

II එම සූත්‍ර දේශනාවෙහි ඇතුලත් නිවණ පිණිස හේතුවන චතුරාර්ය සත්‍යය නම් කරන්න.

III චතුරාර්ය සත්‍ය ධර්මයෙහි පළමු ආර්ය සත්‍යය කෙටියෙන් විස්තර කරන්න.

IV අනේකවිධ දුක් කරදර වලින් පීඩාවට පත් වර්තමාන ගිහි ජනතාවගේ දුක්ඛ නිරෝධය සඳහා මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ හැකි ආකාරය පෙන්වා දෙන්න.

[[2014/2015]] 05 වන ප්‍රශ්නය

I –

II –

III –

IV බුදුරදුන් ලොවට හෙළි කළ ශ්‍රේෂ්ඨ ධර්මයේ විශේෂතාව ගෙනහැර දක්වන්න.

[[2013/2014]] 05 වන ප්‍රශ්නය

I ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි ඇතුළත් චතුරාර්ය සත්‍යය නම් කරන්න.

II දුක්ඛ සමුදය ආර්ය සත්‍යයට අයත් තණ්හාවේ ප්‍රභේද දක්වන්න.

III බුද්ධ කාලීනව මිත්‍යා ප්‍රතිපදාව අන්ත දෙකක් ලෙස බැහැර කරන අයුරු දම්සක් පැවතුම් සූත්‍රයට අනුව පෙන්වා දෙන්න.

IV නිවන් ලැබීමේ ආර් ය මාර්ගය ලෙස මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමේ වැදගත්කම පහදන්න.

[[2012/2013]] 05 වන ප්‍රශ්නය

I දම්සක් සූත්‍රයේ පැවිද්දෙකු විසින් අත් හළ යුතු අන්ත දෙකක් දැක්විණි. එම අන්ත දෙක නම් කරන්න.

II එම සූත්‍රයේ දැක්වුණු මධ්‍යම ප්‍රතිපදාවේ අංග අට නම් කරන්න.

III පස්වග තවුසන්ට දහම් දෙසූ ආකාරයත් ඔවුන් සත්‍යාවබෝධය ලත් අන්දමත් බුදු සසුනේ පැවිද්ද ලැබූ ආකාරයත් විස්තර කරන්න.

IV ප්‍රථම ධර්මදූත කණ්ඩායම නම් කොට, බුදුරදුන් ඔවුන්ට දුන් අවවාදය පැහැදිලි කරන්න.

[[2011/2012]] 05 වන ප්‍රශ්නය

I චතුරාර්ය සත්‍යය නම් කරන්න.

II උපක ආජීවක බුදුරදුන් හමුවේදී උපක විසින් අසන ලද පැනයත්, බුදුරදුන් විසින් දුන් පිළිතුරත් දක්වන්න.

III පළමුව තෙරුවන් සරණ ගිය උපාසකතුමා සහ උපාසිකාව නම් කර,එක සිදුවීම් සැකෙවින් දක්වන්න.

IV උපක ආජීවක හමුවේ සිට යසකුල පුතු ඇතුළු මිතුරන්ගේ පැවිද්ද දක්වා බුදුසසුනේ සිදුවීම් විස්තර කරන්න.

[[2010/2011]] 04 වන ප්‍රශ්නය

I –

II –

III –

IV බුදුරදුන්ගේ ප්‍රථම භික්ෂූ ශ්‍රාවකයින් පස් දෙනා අර්හත්වයට පත්වීමේ පුවත විස්තර කරන්න.

[[2009/2010]] 05 වන ප්‍රශ්නය

I –

II –

III තපස්සු භල්ලුක නම් වෙළඳ සහෝදරයන් හමු වූ තැන් සිට යසකුල පුතු පැවිදිවීම තෙක් බුදුසිරිත පිළිවෙළින් දක්වන්න.

IV බුදුරදුන් කිඹුල්වත් පුරයට වැඩමවීමේ පුවත කෙටියෙන් විස්තර කර එහිදී සිදුවූ විශේෂ සිදුවීම් කවරේදැයි දක්වන්න.

06 වන ප්‍රශ්නය

I බුදු සසුනේ ප්‍රථම රහත් සැටනම නම් කරන්න.

[[2007/2008]] 05 වන ප්‍රශ්නය

I –

II –

III බුදුන් ප්‍රථම ධර්ම දේශනය පවත්වන ලද්දේ කවුරුන් හටදැයි දක්වා, එම දේශනයේදී ඔවුන් සත්‍යය වටහා ගත් ආකාරය පැහැදිලි කරන්න.

IV දම්සක් පැවතුම් සූත්‍රයේ ඇතුළත් මූලික කරුණු නම් කර එම දේශනය පෙර නොඇසූ විරූ දහමක් ලෙස හැඳින්වූයේ මක් නිසා දැයි පහදන්න.

[[2006/2007]] 05 වන ප්‍රශ්නය

I –

II –

III බුදුරදුන්ගේ ප්‍රථම ධර්ම දේශනය නම් කර, එම දේශනයේ ඇතුළත් මූළික කරුණු සැකෙවින් දක්වන්න.

[[[2003]]] 06 වන ප්‍රශ්නය

I සේවනය නොකළ යුතු අන්ත දෙක බුදුරදුන් විසින් හැඳින්වූ අයුරු සැකෙවින් දක්වන්න.

II මධ්‍යම ප්‍රතිපදාව යනු කුමක් දැයි විස්තර කරන්න.

[[[2002]]] 05 වන ප්‍රශ්නය

I "යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං" මෙම පාඨයේ සරළ අදහස ලියන්න.

II පස්වග තාපසයන් වහන්සේලා ධර්මාවබෝධය ලැබූ අවශ්ථා ව විස්තර කරන්න.

[[[1998]]] 05 වන ප්‍රශ්නය

I ජනතාව අතර බුදු දහම ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමට බලපෑ හේතු සාධක ඉදිරිපත් කරන්න.

II පස්වග තවුසන්ට දහම් දෙසීමේ සිට බුදු රජාණන් වහන්සේ රජගහනුවරදී බිම්බිසාර රජතුමා හමුවන තෙක් සංඝ සමාජය වර්ධනය වූ අයුරු විස්තර කරන්න.

[[[1996]]] 08 වන ප්‍රශ්නය

අර්හත් ඵලාවබෝධය දක්වා පස්වග තවුසන්ගේ ශික්ෂණය සඳහා අනුගමනය කොට ඇති ක්‍රියා මාර්ග විස්තර කරන්න.